www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# 9/11 සිට පස් වසරක දේශපාලන ශේෂපත්‍රයක්

*තෙවන කොටස*

**Five years since 9/11: A political balance sheet**
**Part three**

**ඩේවිඩ් නෝර්ත් විසිනි**
**2006 සැප්තැම්බර් 13**

## ඇමරිකානු සමාජයේ තත්වය

ඌටාහි පැවති ඇමරිකානු එක්සත් ජනපද ජාතික සම්මේලනය අමතා අගෝස්තු 31 දින පැවැත්වූ කතාවේ දී ජනාධිපති බුෂ් කියා සිටියේ, "ඡන්ද දායකයන්ට වගකිව යුතු ආන්ඩු, පාරවල් හා පාසල් ගොඩනැගීමට මිස ජනඝාතක අවිවලට සිත යොමු නොකලයුතු" බවයි. එම මිම්මෙන්, එක්සත් ජනපදය තරම් අඩුවෙන් ජනතාවට වගකියන වෙනත් කිසිදු ආන්ඩුවක් ඇත්තේ නැත! ෆෙඩරල් අයවැයෙන් පාරවල් ඉදි කිරීමට හා අධ්‍යාපනයට වෙන් කරන කොටස, නිල මිලිටරි පිරිවැයෙන් සියයට දහයටත් අඩු ය.

දේශීය හා විදේශීය ප්‍රතිපත්ති එකිනෙකින් වෙන් කරන, විනිවිද යා නොහැකි බාධකයක් ඇත්තේ නැත. දෙකෙන්ම, වෙනස් වූ රූපයන්ගෙන් ප්‍රකාශ කරන්නේ පාලක පැලැන්තියේ අවශ්‍යතාවන් හා දෘෂ්ටියයි. එක්සත් ජනපදයේ විදේශ පිලිවෙත වනාහි එරට පාලනය කරන මූල්‍ය හා ව්‍යාපාරික කතිපයාධිපත්‍යයේ පන්ති අවශ්‍යතාවන්, ලෝක දේශපාලන ක්ෂේත්‍රය ඇතුලත ප්‍රකාශයට පත්වන ආකාරයයි. සැබැවින්ම, එක්සත් ජනපද ආක්‍රමනයෙන් ඉක්බිත්තේ, ඉරාක ජනතාවගේ දූවෙන අවශ්‍යතාවන් කෙරෙහි බුෂ් පරිපාලනය ප්‍රදර්ශනය කල නොතැකීම හා කැත්‍රිනා කුනාටුවෙන් පසුව, නිව් ඕර්ලියන්ස්හි පුරවැසියන් කෙරෙහි දැක්වූ සාපරාධී නොතැකීම ද අතර කැපී පෙනෙන සමාන්තරයක් පවතී. සමස්ත නගරයක්ම විනාශ වී යන තෙක් ආන්ඩුව ඔහේ බලා සිටි අතර, දහස් ගනනකගේ ජීවිත අහිමිවී දසදහස් ගනනකට උන්හිටි තැන් අහිමි විය.

දුර්ජනකම පමනක් නොව පාලක පැලැන්තියේ අකාර්යක්ෂමතාවය ද නිව් ඕර්ලියන්ස්හි දී ප්‍රදර්ශනය වූයේ බැග්ඩෑඩ්හිදීට වඩා අඩුවෙන් නොවේ.

නොහැකියාවේ මෙම මූලය, අහම්බ ප්‍රපංචයක් නොව, එක්සත් ජනපද සමස්ත සමාජ ව්‍යුහය තුල පවතින කුනුවීමේ හා දිරාපත්වීමේ සැබෑ හා ප්‍රගාඪ ප්‍රවනතාවන්ගේ පිලිබිඹුව ය. එහි පාලක පන්තියේ ධනය වැඩිවන්නේ රටේ කාර්මික හා උපරිව්‍යුහයේ බිඳ වැටීමට සමානුපාතික දර්ශකයකිනි. පාලක පැලැන්තිය එන්ට එන්ටම පාතාලයේ දේහ ලක්ෂනවලට අනුකූලවෙමින් තිබි දූවැන්ත පෞද්ගලික ධන සම්භාරයන් එක්රැස් කරනුයේ නිෂ්පාදන බලවේගයන්ගේ සංවර්ධනය තුලින් නොව ඒවායේ විනාශය තුලිනි. අඩුම තරමින් සුවිශාල කර්මාන්ත නිර්මානය කිරීම සමග එක්ව ගත්, පෞද්ගලික අනුකම්පා විරහිත භාවයෙන් යුත් කාර්මික යෝධයන්ගේ යුගය දැන් අයත්වන්නේ ඈත අතීතයට ය. සමකාලීන ඇමරිකාව තුල ව්‍යාපාරයේ ප්‍රධාන විධායක නිලධාරියා (සීඊඕ) වනාහි පරපෝෂිත ආර්ථික පද්ධතියක පුද්ගලාරූඪයයි. ඔහුගේ ප්‍රධාන කර්තව්‍යය වන්නේ මූල්‍ය සන්තෘෂ්ඨීය හා වරප්‍රසාදිත කුඩා ප්‍රභූ කොටසකගේ ධනවත් වීම යි. ව්‍යාපාර සැලසුම් කරනයට බොහෝ දුරට ඇතුලත් වන්නේ, සමාගම් සම්පත් දිගුකාලීන ආයෝජනයෙන් හා නිෂ්පාදනයෙන් ඉවතට හරවා විධායකයන්ගේ හා මහා කොටස් හිමියන්ගේ පෞද්ගලික බැංකු ගිනුම්වලට බැරකිරීම යි.

2006 ජූලි 15 දින *වෝල්ස්ට්‍රීට් ජර්නලය*, 9/11 ඛේදවාචකය කෙරෙහි ප්‍රධාන ඇමරිකානු ව්‍යාපාරවල ප්‍රතිචාරය පිලිබඳ විශ්ලේෂනයක් මුල්පිටේ පලකරන ලදී. කෝටි සංඛ්‍යාත සාමාන්‍ය ඇමරිකානුවන්, 2500කට වැඩි සිය සහෝදර පුරවැසියන්ගේ මරන පිලිබඳව ශෝක වෙද්දී එක්සත් ජනපදයේ විශාලතම සමාගම්වල ප්‍රමුඛ විධායකයන් තමන්ට ධනවත් වීම සඳහා ඛේදවාචකයෙන් සැලසුනු අනපේක්ෂිත අවස්ථාවෙන් කුල්මත් වූහ.

ලෝක වෙලඳ මධ්‍යස්ථානයට එල්ල වූ ප්‍රහාරයෙන් පසුව කොටස් වෙලඳපොල දින 6ක් වසා තැබුනි. 2001 සැප්තැම්බර් 17 දින වෙලඳපොල යලි විවෘත කිරීමෙන් පසුව කොටස් මිල සියයට 14කට වැඩි ප්‍රමානයකින් පහත වැටුනි. ප්‍රධාන සමාගම් 186ක ප්‍රධාන විධායකයන්, කොටස් වටිනාකම්වල ප්‍රපාතාකාර හා තාවකාලික වැටීමේ වාසිය ඩැහැ ගත්තේ, පාදක මිල සඳහා කේවෙල් කිරීමේ දී තමන් වෙත ලාභදායී කොටස් විකල්පයන්ගෙන් පිදුම් ලැබී ය. සාමාන්‍යයෙන්

විකල්පයන් ප්‍රදානය නොකරන සමාගම් 91ක් 2001 සැප්තැම්බර් 17න් පසුව එය ලබා දුන්නේ ඩොලර් මිලියන 325ක් වටිනා විකල්පයන් සමග ය.

මෙයින් සමහර සමාගම්වලට 9/11 ඛේදවාචකයෙන් සේවකයන් අහිමි විය. නිදසුනක් ලෙස මෙරාඩයින් කෝපරේෂන් හි සේවකයෙක් ඇමරිකන් ෆ්ලයිට් 11න් අහිමි විය. එහෙත් එහි සීඊඕ, ඛේදවාචකය සිය පෞද්ගලික ලාභය සඳහා හරවාගැනීමට එම අවස්ථාව අත් නොහලේ ය. ඔහු විකල්ප 600,000කින් පිදුම් ලැබූ අතර එමගින් ඔහුට 9/11ට පෙර තිබූ මට්ටමට වඩා සියයට 24ක් අඩුවෙන් කොටස් මිලට ගත හැකිවිය.

ටෙරාඩයින් හි සීඊඕ වනාහි 9/11 වාසනාවන්ත ප්‍රහාරයක් බවට පත් කරගත් විධායකයන් අතුරෙන් එක් අයෙක් පමනි. ටී. රෝව් ප්‍රයිස් සමාගම විකල්ප 280,000 විධායකයින් දෙදෙනෙකුට ලබා දුන්නේ ය. මෙරිල් ලින්ච්හි සීඊඕ 753,770ක් ලැබීය. හෝම් ඩිපෝහි සීඊඕ විකල්ප මිලියනයක් ලැබීය. *වෝල්ස්ට්‍රීට් ජර්නලය* අසන පරිදි "සමාගම් ජාතික ඛේදවාචකයකින් කුපාඩි ලෙස වාසි ලැබුවේ ද?" ඔබ එසේ කියනවා විය හැකි ය. එහෙත් මට ඒ ගැන කිය නොහැකි ය!

මරනය හා විනාශය මතින් වෝල් වීදියේ විධායකයන් මිල අධික ත්‍යාග හිමි කර ගැනීමේ මෙම අන්ධකාර හා හොල්මන් කථාව, පශ්චාත් 9/11 ඇමරිකාවේ සමාජ යථාර්ථයෙහි සැබෑ ප්‍රකාශනයකි. "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" ගෙවී ගිය පස්වසර තුල, පූර්ව 9/11 කාලයේ ධනය ඒකරාශී වීමේ හා සමාජ අසමානතාවයේ ප්‍රවනතාවන් වේගවත් වී ඇත.

තෝමස් පිකටි හා එමැනුවෙල් සඑස් යන පිලිගත් අර්ථශාස්ත්‍රඥයන් විසින් පිලියෙල කල ආදායම් විශමතාවය පිලිබඳ මෑත දී නිකුත් කල වාර්තාවක, එක්සත් ජනපදයේ ධනය ඒකරාශි වීමේ සීඝ්‍රතාවය වේගවත් වීම ගැන සඳහන් කරයි. 1913 හා 1998 අතර එක්සත් ජනපදයේ ආදායම් විෂමතාවය පිලිබඳ 2003 ඉදිරිපත් කල සිය විශ්ලේෂනයේ අතිරේකයක් සපයමින්, පිකෙටි හා සඑස් විසින් විමර්ෂනය කල මෑත දත්තවලින් ඇමරිකානු සමාජයේ ධනවත්ම සියයට 1 අත් කර ගත් ආදායම, පහල ම සියයට 99 විසින් අත් කරගත්තාට වඩා කිහිප ගුනයක සැලකිය යුතු වැඩිවීමක් බව තහවුරු කරයි. තවද, ලොකුම වැඩි වීම භුක්ති වින්දේ සමාජයේ ඉහල ම සියයට දශම එකකි.

අයවැය හා ප්‍රතිපත්ති පිලිබඳ මධ්‍යස්ථානය මගින් සකස්කල පිකටි-සඑස්ගේ තොරතුරුවල සාරාංශයට අනුව

* 2003-04 දී කුටුම්බයන්ගේ පහල ම සියයට 99, උද්ධමනයට බරතැබීමෙන් පසුව සාමාන්‍ය ආදායම ඉහල ගියේ සියයට තුනකින් ය. සාමාන්‍ය ආදායමේ මෙම සංඛ්‍යාව, කුටුම්බයන්ගේ ඉහල ම සියයට 20 හිමි කර ගැනීම් කිසි සේත් ම පිලිබිඹු නොකරයි. වෙනත් වචනවලින් කිව හොත්, කුටුම්බයන්ගේ පහල ම සියයට 80 අතර ආදායම් වර්ධනය, එක්කෝ එක තැන පල්විය, නැතහොත් පහල වැටුනි.

* වාර්ෂිකව ඩොලර් 315,000කට වැඩියෙන් උපයන කුටුම්බයන්ගේ ඉහලම සියයට 1 වෙත, සාමාන්‍ය ආදායම් ලැබීම්වලින් සියයට 41 ගලා ගියේ ය.

* ඉහල ම සියයට එක විසින් බදු ගෙවීමට පෙර ආදායමෙන් හිමි කර ගත් කොටස 2003 දී සියයට 17.5ක සිට 2004 දී සියයට 19.5 දක්වා ඉහල ගියේ ය. 1913 පටන් මෙම පරිමානයේ ඉහල නැගීමක් සිදු වී ඇත්තේ 5 වතාවක් පමනි.

* පසු ගිය දශකයේ වෙලඳපොල පිම්බීමේ බුබුලෙහි මල් පල ගැන්වීම හටගත් කල 1999 හා 2000 වසරවල සුවිශේෂත්වය අත්හල විට 2004 එක්සත් ජනපදයෙහි මුලු ආදායමෙන් ඉහලම සියයට 1 කොටස 1929න් පසු ඕනෑ ම අවස්ථාවක හිමි කර ගත් කොටසට වඩා විශාල විය.

* 2003ත් 2004ත් අතර කුටුම්බයන්ගේ ඉහල ම සියයට එකෙන් ඉහල ම දහයෙන් එක හිමි කර ගත් ජාතික ආදායමේ පංගුව සියයට 7.9 සිට සියයට 9.2 දක්වා සියයට 1.3කින් ඉහල ගියේ ය. මෙහි සැබෑ තේරුම නම් කුටුම්බයන්ගේ ඉහල ම සියයට එකට හිමි වූ සියලු ම ආදායමින් අඩකට වැඩි පංගුවක් එක්සත් ජනපදයේ ධනවත්ම පවුල් සියයට 0.1 එනම් ඇමරිකානු සමාජ කතිපයාධිකාරයේ ඉහල මට්ටම්වලට හිමි වූ බවයි.

1970 ගනන් මැද ආරම්භ වූ සමාජ අපගමනයේ ප්‍රවනතාවක් ක්‍රමයෙන් වඩාත් ඉහල මට්ටම් කරා ගමන් ගත් ආකාරය 2003-2004 සංඛ්‍යාවන්ගෙන් පෙන්නුම් කරයි. ඊට පූර්වයෙන් එනම් දෙවැනි ලෝක සංග්‍රාමය අවසානයේ පටන් 1973-75 ආර්ථික පසුබෑම තාක් ජාතික ආදායමෙන් කම්කරු පන්තික පවුල් හිමි කරගත් පංගුව සැලකිය යුතු පරිදි වර්ධනය විය. එම ප්‍රවනතාවය කාටර් පාලනාධිකාරයේ අවධිය තුල ආරම්භ වී ජනාධිපති රේගන් හා ඔහුගේ අනුප්‍රාප්තිකයන් විසින් උග්‍ර කල කම්කරු පන්තියට එරෙහි ව්‍යාපාරික ප්‍රතිප්‍රහාරය මගින් ආපසු හැරවී ය.

එක්සත් ජනපදය තුල ධනය සමුච්චය වීමේ විශ්මයජනක මට්ටම, නොඑසේනම් සෞඛ්‍ය සම්පන්න සමාජයක ඇති වූ අවාසනාවන්ත කලු ලපයක් නොවේ. එය පැන නගින්නේ, ධනවාදයේ සමාජ සම්බන්ධතාවන්ට කාවැදීගත් හා නිෂ්පාදන මාධ්‍යයන්ගේ පෞද්ගලික අයිතියේ පදනම මත වුවත් ආර්ථික හා දේශපාලන ජීවිතයේ ගමන්මගෙහි ප්‍රධාන හා තීරනාත්මක සාධකයක් බවට පත්වීමට තරම්, එක්සත් ජනපදයේ ධනවත්ම මිනිසුන්ගේ ධනය, පාලනය කල නොහැකි පරිදි ඉහල යෑම, දැවැන්ත පරිමාවකට සිදු වී තිබේ. විදේශීය හා දේශීය ප්‍රතිපත්ති

සෑම අංශයක් මත්, ජාතික ප්‍රමුඛතාවන් පිහිටුවීමත්, පෞද්ගලික ධනය තවතවත් පුලුල් කරගැනීම සඳහා පාලන කතිපයාධිකාරයේ කෑදර ඉල්ලීම් මගින් ඍජුලෙස ද වහාම ද තීරනය කෙරේ.

ව්‍යාපාරික ප්‍රමුඛතාවන් පිහිටුවීම ද, ව්‍යාපාරික මූලෝපායන් සැකසීම ද මුලුමනින්ම පාහේ තීරනය කරනුයේ, සමාගම් විධායකයන්ගේ පෞද්ගලික ආදායමට ඉන් ඇතිකෙරේ යයි අපේක්ෂිත බලපෑම මතය. නූතන ඇමරිකානු ව්‍යාපාරයන්ගේ ප්‍රධාන හා මූලික අරමුන, එහි විධායකයන්ටත්, ප්‍රමුඛ කොටස් හිමියන්ටත් ඩොලර් කෝටි ගනන් වාර්ෂිකව බෙදී යන බවට වගබලාගැනීමයි.

පාලක ප්‍රභූ පැලැන්තියේ සමාජ පැවැත්ම රඳා ඇත්තේ සමාජය සමස්තයක් ලෙස සූරා කෑම හා කොල්ලකෑම මතය. අස්වාභාවික හා සැබවින්ම කුපාඩි මට්ටමකට, උමතු ලෙස පෞද්ගලික ධනය අත්කර ගැනීමේ තීන්දු ගැනීමේ දී, ඉන් ඇතිකරන දිගුකාලීන බලපෑම - සමාගම් ඒවායේ නිෂ්පාදන පදනම වැඩිදියුනු කිරීමටත් සංවර්ධනයට හා පර්යේෂන සඳහාත් අවශ්‍ය අරමුදල් පිපාසාවෙන් පෙලෙන අතර, නිෂ්පාදන ආයෝජනය වෙතින් සම්පත් බංකොලොත් අදූරදර්ශී හා සමාජීයව විනාශකාරී සමපේක්ෂනයන් වෙත හරවා යැවීම, සියල්ලටත් වඩා සමාජයේ යටිතල ව්‍යුහය ඛාදනය වීමත්, සමාජයේ එන්ට එන්ටම විශාල කොටස් දරිද්‍රතාවයට ඇද වැටීමත් - පිලිබඳ විශේෂ අවධානයක් පාලක පැලැන්තිය තුල ඇත්තේ නැත. වර්සේල්ස් රාජසභාවෙහි විනෝදවෙමින් සිටි ප්‍රන්ස රදල පැලැන්තිය සේ ම මොවුන් ද තම ක්‍රියාවන්ගේ ප්‍රතිවිපාකයන් කෙරෙහි අන්ධ ය.

ඇමරිකාවේ පාලක කතිපයාධිකාරයේ ක්‍රියාවන් දෙස බැලීමෙන් යමෙකුට, ප්‍රන්ස විප්ලවයේදී හිස් ගසාදමන ගිලටිනය කෙරෙහි වූ උද්යෝගිමත් ජන සහභාගිත්වය ජනිත කල සමාජ ක්‍රියාවලිය වඩා හොඳින් තේරුම්ගතහැකි වේ. පාලක පැලැන්තිය එන්ට එන්ටම ක්‍රියාත්මක වන්නේ සමාජයෙන් පරත්වාරෝපිත හා විෂඝෝර මූලයක් ලෙස ය. ඔවුන්ගේ ඉල්ලීම් ද ඔවුන් සතු වරප්‍රසාද ද, සමස්තයක් ලෙස සමාජයේ අවශ්‍යතාවන් සමග එකට නොගැලපෙන විනාශකාරී ඒවා ය. කෙලින්ම කිව හොත් ධනවතුන් සැබෑ සමාජ ප්‍රශ්නයක් බවට පත්ව තිබේ.

එක්සත් ජනපදය තුල පවත්නා සමස්ත දේශපාලන පර්යාය වනාහි වෙන කිසිවක් නොව මෙම යල්පැනගිය ප්‍රතිගාමී හා සමාජීයව නිෂ්ඵල වාතාවරනයේ සංකේන්ද්‍රිත ප්‍රකාශනයයි. සමස්ත දේශපාලන සංස්ථාපිතයට ම නිවහන වී ඇත්තේ, පලල් ජන සමූහයාගේ සංවේදනයන්ට ද අවශ්‍යතාවන්ට ද ප්‍රතිචාර නොදක්වන හා මුලුමනින්ම හුදකලා වූ ලෝකයකි.

සමාජය මුහුන දී සිටින කිසිදු ගැටලුවක් විවෘතව සාකච්ඡා කල නොහැක. දූවැන්ත සමාගම් විසින් පාලනය කරන ජනමාධ්‍යය, එක්සත් ජනපදය වනාහි සියලු පුරවැසියන් සමාන අවස්ථාවන් භුක්තිවිඳින, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ය යන වැරහැලිවී ගිය ප්‍රබන්ධය මොන වියදමකින් හෝ පවත්වා ගැනීමට උත්සාහ කරයි.

ධනවතුන්ගේ අවශ්‍යතාවන්ගේ ආරක්ෂාව සම්මුති විරහිතව ආරක්ෂා කිරීමට කැප වූ හා මූල්‍ය-ව්‍යාපාරික කතිපයාධිකාරය, එහි වරප්‍රසාදවලට එල්ල වෙන ඕනෑ ම අභියෝගයකින් ආරක්ෂා කරන, වැඩ කරන ජන සමූහයාට මොන ම ස්වාධීන දේශපාලන හඬක් හෝ අහිමි කර තිබෙන දේශපාලන යාන්ත්‍රනය වනාහි, රිපබ්ලිකන් හා ඩිමොක්‍රටික් ද්වි පක්ෂ ක්‍රමයයි.

ඉරාක යුද්ධය කෙරෙහි වූ දූවැන්ත මහජන විරෝධය, දේශපාලන සංස්ථාපිතය තුල කිසිදු බැරෑරුම් ප්‍රකාශනයක් කිසිසේත් අත් කර නොගැනීමේ කාරනය පැහැදිලි කලහැක්කේ කෙසේ ද? යුද්ධයට එරෙහි මහජන විරෝධය වැඩීයත්ම, යුද්ධය පුලුල් ලෙස ගෙන යායුතු බව අවධාරනය කෙරෙන දේශපාලන සංස්ථාපිතය, තව තවත් අශමනීය වේ.

යුද්ධයට එරෙහි අරගලය හා එක්සත් ජනපදය තුල සමාජ පිලිවෙත් දිශානතිය වෙනස් කිරීම, ද්වි පක්ෂ ඒකාධිපතිත්වය විනාශ කිරීම හා කම්කරු පන්තියේ අව්‍යාජ වූ, ස්වාධීන සමාජවාදී දේශපාලන ව්‍යාපාරයක් නිර්මානය කිරීමෙන් තොරව ඉටු කර ගත නොහැකි ය.

මෑත සතිවල සමාජවාදී සමානතා පක්ෂයේ අත්දැකීම, එක්සත් ජනපදයේ ප්‍රජාතන්ත්‍රවාදයෙහි දූෂිත තත්වය කෙරෙහි තියුනු එලියක් විහිදුවයි. ද්විපක්ෂ කතිපයාධිකාරයේ ආධිපත්‍යයට අභියෝග කරන හා ඡන්ද අයිතිය ලබාගැනීම සඳහා උත්සාහ කරන කුමන හෝ "තුන්වැනි පක්ෂයක්"වහාම මුහුන දෙන්නේ, ඩිමොක්‍රටිකයන් හා රිපබ්ලිකානුන් දේශපාලන විරෝධයකට මුහුන දීමෙන් වලක්වා ගැනීමේ එක ම අරමුනෙන් යුතුව ක්‍රියාත්මක වන පරිපාටිමය බාධකයන් සමූහයකට ය. "තෙවැනි පක්ෂය" ඡන්ද අයිතිය ලබාගැනීම සඳහා නීතියෙන් අවශ්‍යව ඇති අත්සන් දහස් ගනනක් රැස් කර ගැනීමෙන් පසුව ද එයට, අප්‍රමාන වූ නරුම හා ව්‍යාජ නීති අභියෝගයන්වලට මුහුන පෑමට සිදු වේ. එහි එකම අරමුන පාලක කතිපයාධිකාරයේ දෙපක්ෂයට කුමන හෝ විකල්පයක් තෝරාගැනීමට මහජනතාවට ඇති අයිතිය අහිමි කිරීමයි.

ඉලිනොයිස්හි 52වන දිස්ත්‍රික්කයෙහි සමාජවාදී සමානතා පක්ෂයට කිරීමට බල කෙරුනු අරගලය, දේශපාලන පර්යායේ තරයේම ප්‍රජාතන්ත්‍ර විරෝධී හා පීඩාකාරී ස්වභාවයේ මූලික වෙනසක ප්‍රකාශනයයි. ඡන්දයට ඉදිරිපත් වීමේ දී සසප අපේක්ෂකයා වන

ජෝ පැනරවුස්කිස්ගේ අයිතිය වෙනුවෙන් (දිස්ත්‍රික්කයේ ලියාපදිංචි ඡන්ද දායකයන් ගෙන් සැලකියයුතු ප්‍රතිශතයක්) නිවැසියන් දහස් ගනනක් පෙත්සමට අත්සන් තැබූහ. එහෙත්, තවමත් ඩිමොක්‍රටික් පක්ෂය ඔහු ඉදිරිපත්වීම වැලැක්වීම සඳහා නීති ගාස්තු වසයෙන් ඩොලර් දසදහස් ගනනක් වැය කරති. ඩිමොක්‍රැටිකයන් විසින් සිදු කල සියලු බාධාකිරීම්වලින් පසුව, ඒවායේ කිසිදු නීතිමය ද්‍රව්‍යයක් නොමැති බව පෙනීගොස් තිබියදීත්, දූන් පවා ඔවුන්ගේ ක්‍රියාකාරීන්, සසප අපේක්ෂකයාගේ නම ඡන්ද ලේඛනයට ඇතුල් කිරීම සහතික කිරීම සරලවම ප්‍රතික්ෂේප කරති.

තනි කුඩා සෙනේට් අසුනක් සඳහා තරග කරන ස්වාධීන අපේක්ෂකත්වය වැලැක්වීම මෙසේ සිදුවන්නේ නම්, පාලක පැලැන්තියේ අවශ්‍යතාවන්ට වඩාත් ඍජු ලෙස තර්ජනය කරන මහජන දේශපාලන ව්‍යාපාරයක් වර්ධනය වීමට එහි ප්‍රතික්‍රියාව කුමක් වේදැයි සිතාගන්න.

එක්සත් ජනපදයේ දේශීය හෝ විදේශීය ප්‍රතිපත්තියේ කිසිදු ප්‍රගතිශීලී වෙනසක්, එනම් ඇමරිකානු ධනවාදයේ ගෝලීය අවශ්‍යතාවන් හා ඔවුන්ගේ ධනයට තර්ජනයක් වන කිසිදු පියවරක් ගැනීම, විප්ලවවාදී අරගලයකින් තොරව සිදු නොවනු ඇතැයි පාලක පැලැන්තිය සිය ක්‍රියාවන්ගෙන් ම ඔප්පු කර තිබේ.

අවසාන වසයෙන්, 9/11න් පස්වසරකට පසුව පවතින තත්වය හැකිතාක් සංක්ෂිප්තව දක්වමු. එම දිනයේ සිදුවීම්වලින් සැපයුනු නිමිත්ත එහි ගෝලීය ආධිපත්‍යය සඳහා වූ චාරිකාව පුලුල්කිරීම සඳහා ප්‍රයෝජනයට ගැනීමට ඇමරිකානු අධිරාජ්‍යවාදයේ තල්ලුව, අනපේක්ෂිත විරෝධයකට හා දුෂ්කරතාවන්ට මුහුන පා ඇත. ඉරාකය ජයගෙන සාමය ඇතිකිරීමට අසමත්වීම ඇමරිකානු මිලිටරියේ අපරාජිතය යන ප්‍රතිරූපයට යටින් වලකපා ඇත. ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ආධිපත්‍යවාදී ව්‍යාපෘතිය දැනට පස් වසරකට පෙර දීට වඩා දැන් ගැටලු සහගත වී ඇති බව පෙනේ.

කෙසේ වුව ද ඇමරිකානු පාලක පැලැන්තිය එහි ගෝලීය අභිප්‍රායන්ගෙන් පසු බැසීම ශක්‍ය විකල්පයක් ලෙස සලකන්නේ නැත. අධිරාජ්‍යවාදයේ තර්කනය එක්සත් ජනපදයට බල කර සිටින්නේ එනම් ප්‍රථමයෙන් ඉරානයටත් පසුව චීනයටත්, ඇමරිකානු ආධිපත්‍යයට තර්ජනයක් විය හැකි වෙනත් ඕනෑ ම රටකට හා රටවල් කන්ඩායමකට එරෙහිව නව හා වඩාත් ප්‍රචන්ඩ මැදිහත්වීම්වලට ය.

එහෙත්, බුෂ් විසින් පොරොන්දු වී ඇති "21 වැනි සියවසේ යුද්ධ" නොවැලැක්වියහැකි පරිදි ම එක්සත් ජනපදය තුල සමාජ ප්‍රතිවිරෝධයන් ගැඹුරු කරනු ද පෙර නොවූ විරූ මට්ටම්වලට මහජන විරෝධය හා අරගල පැන නංවනු ද ඇත. දැනට මත් ප්‍රත්‍යක්ෂ වී ඇති ආකාරයට මහජන අතෘප්තියේ හා ක්‍රෝධයේ මනෝගතිය පුලුල් ද උග්‍ර ද වනු ඇත. සමාජ තත්වයන්ද, අසමානතාව ද, ප්‍රජාතන්ත්‍රීය අයිතීන් හා අධිරාජ්‍යවාදී යුද්ධය ද පිලිබඳ අන්තර් සම්බන්ධිත ප්‍රශ්න මහජන විඥානය මත වඩවඩාත් එකට වෙලී ගනු ඇත.

දේශපාලන පල්වීමේ දිග් ගැසුනු අවධිය අවසානයක් කරා ඇදෙමින් තිබේ. එක්සත් ජනපදය තුල සමාජ හා දේශපාලන අරගලයේ නව හා කැලඹිලිකාරී අවධියක් වේගයෙන් එලඹෙමින් තිබේ. දැනට දියත්වෙමින් තිබෙන මැතිවරන ව්‍යාපාරය තුල සමාජවාදී සමානතා පක්ෂයේ වැඩ කටයුතු ප්‍රානවත් කරන ඉදිරිදර්ශනය මෙයයි.

© www.wsws.org